සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# පළමු වාර පරීක්ෂණය 2018

**9 ශ්‍රේණිය**

# චිත්‍ර කලාව

**කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

---

## I කොටස

- **පහත දැක්වෙන ඡායාරූපය හඳුනාගෙන අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01 පූජනීය ස්ථානයකට පිවිසෙන පඩිපෙළ පාමුල සඳකඩ පහණට දෙපසින් පිහිටා ඇති මෙය ................................ ................................ නමින් හැඳින්වේ.

02 ඉහත රූපයෙන් දැක්වෙන්නේ අනුරාධපුර යුගයට අයත් හොඳම නිර්මාණයයි. එය .................................... .................................... යෙන් හමුවේ.

03 මුල්කාලීනව කැටයම් රහිත ගල් පුවරුවක් ලෙස විකාශනය වූ මෙහි දැකිය හැක්කේ .................................................. රූවයි.

04 පොළොන්නරු යුගයේ මෙවැනි උසස්ම නිර්මාණය හමුවන්නේ ........................................................................ පිවිසුම් දොරටුව අසලින් ය.

05 මෙම රූපය නෙළීමේ දී ශිල්පියා ............................................. ශිල්ප ක්‍රම භාවිතා කර ඇත.

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයන්න.**

06 හින්දු ආගමේ දේව රූප තැන්පත් කර පෙරහැරේ ගෙනයෑමට භාවිතා කරන වාහන වර්ගය හඳුන්වන පොදු නාමය කුමක් ද? ..........................................................................................................

07 පංති කාමරයේ දී මූර්තියක් නිර්මාණය කිරීමට භාවිතා කළ හැකි වඩාත් පහසුම මාධ්‍ය නම් කරන්න.

..........................................................................................................

08 සෙනරත් පරණවිතාන මහතාගේ මතයට අනුව සඳකඩ පහණේ ඇති ඇත්, අශ්ව, සිංහ, ගව යන සත්වාවලියෙන් සංකේතවත් වන්නේ කුමක් ද? ..........................................................................

09 මකර කට තුළින් විහිදී යන රිද්මයානුකූල දියරැල්ලක් සියුම්ව කැටයම් කර ඇති අගනා කලා නිර්මාණය නම් කරන්න. ..........................................................................................................

10 සම්ප්‍රදායික සිංහල සැරසිලි මෝස්තර අතර ඉර, හඳ නැමැති මෝස්තර අයත්වන වර්ගය කුමක් ද?

..........................................................................................................

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 උඩරට නර්තන සම්ප්‍රදාය හා බැඳි ශාන්තිකර්මයක් ලෙස සැලකෙන්නේ,

(1) දෙවොල්මඩුව ශාන්තිකර්මයයි. (2) කොහොඹා කංකාරිය ශාන්තිකර්මයයි.

(3) පහන්මඩුව ශාන්තිකර්මයයි. (4) කුම්බාඩිෂේකම් ශාන්තිකර්මයයි.

12 මැටි භාණ්ඩ නිර්මාණය කිරීමේ දී ඉතා විශාල භාණ්ඩ පහසුවෙන් නිර්මාණය කරගත හැක්කේ,

(1) අත් සකපෝරුව භාවිතයෙනි. (2) පා සකපෝරුව භාවිතයෙනි.

(3) ඇඹීමේ ශිල්පක්‍රම තුළිනි. (4) නෙළීමේ ශිල්ප ක්‍රමය තුළිනි.

13 ධ්‍යාන මුද්‍රාවෙන් නිර්මාණය කර ඇති සුප්‍රකට ප්‍රතිමාවක් වන්නේ,

(1) අවුකන බුද්ධ ප්‍රතිමාව (2) සාරානාත් බුද්ධ ප්‍රතිමාව

(3) අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාව (4) ගල්විහාර හිටි බුද්ධ ප්‍රතිමාව

14 කාන්තා දේව රූප සඳහා බහුලව භාවිතා කළ පහළට වැටුණු අතෙහි අත්ල හා ඇඟිලි රිද්මයානුකූලව පොළවට දිගුවන ලෙස නිරූපණය වන්නේ,

(1) ලෝල හස්ත මුද්‍රාවෙනි. (2) කටක හස්ත මුද්‍රාවෙනි.

(3) අභය මුද්‍රාවෙනි. (4) විතර්ක මුද්‍රාවෙනි.

15 මූලික වර්ණ කාණ්ඩයට අයත් වර්ණ වනුයේ,

(1) නිල්, කොළ, කහ වර්ණයයි. (2) නිල්, කහ, රතු වර්ණයයි.

(3) දම්, කොළ, නිල් වර්ණයයි. (4) දම්, කොළ, තැඹිලි වර්ණයයි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති වචනය අර්ථය පැහැදිලි වනසේ වාක්‍ය බැගින් ලියන්න.**

16 පේසාවළලු ..............................................................................................



17 වාත්තු කිරීම ..............................................................................................

18 කුම්බා ..............................................................................................

19 ව්‍යාප්ත මෝස්තර ..............................................................................................

20 ද්විතියික වර්ණ ..............................................................................................

- **අංක 21 සිට 25 දක්වා දී ඇති රූප සටහන්වලට අදාළ පිළිතුර ඉදිරියේ ඇති A, B, C, D, E අක්ෂර අතුරින් තෝරා තිත් ඉර මත ලියන්න.**

| | | | | |
|---|---|---|---|---|
| 21 |  | (...............) | A | ලෝකඩ වලින් කළ නිර්මාණයකි. |
| 22 |  | (...............) | B | අභය මුද්‍රාව දක්වෙන නිර්මාණයකි. |
| 23 |  | (...............) | C | සඳකඩ පහණේ දක්නට ඇති සත්ත්ව රූපයකි. |
| 24 |  | (...............) | D | කොරවක්ගලේ දැකිය හැකි නිර්මාණයකි. |
| 25 |  | (...............) | E | ප්‍රාග් ඓතිහාසික ගුහා නිර්මාණයකි. |

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

26 සිතුවමක් ඇඳීමේ දී ළඟ ඇති වස්තු විශාලවත්, දුර ඇති වස්තු කුඩාවටත් ඇඳීම .......................................... ලක්ෂණය ලෙස හැඳින්වේ.


27 යාපනයේ මුලායිහි සිත්ති විනායාගර් කෝවිලෙහි දැකිය හැකි සිම්ම වාහනම් (සිංහ රථය) ................................................................. සියවසේ දී නිමවූවකි.

28 අනුරාධපුර යුගයේ බිහිවූ සඳකඩ පහණ අතර කලාත්මක අතින් උසස්ම නිර්මාණය ලෙස ............................................................................................................ සඳකඩ පහණ දැක්විය හැක.

29 අතීතයේ දී විශිෂ්ට කැටයම් සහිත පියගැට පෙළ නිර්මාණය කර ඇත්තේ .................................. මාධ්‍යයෙනි.

30 කඩදාසි කැබලිවලට ඉරා එය හැඩයක් මතුවනසේ අලවා කරනු ලබන නිර්මාණ .............................................. ලෙස හඳුන්වයි.

- **අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



**F** **G** **H** **I** **J**

31 F අක්ෂරයෙන් දැක්වෙන සාම්ප්‍රදායික මල් මෝස්තරය නම් කරන්න. ..........................................................

32 G අක්ෂරයෙන් දැක්වෙන පලාපෙති මෝස්තරය අයත්වන කාණ්ඩය කුමක් ද? ..............................................

33 H අක්ෂරයෙන් දැක්වෙන පැරණි ශිල්පියා ගෝලයාට ලබාදුන් මුල්ම අභ්‍යාසයට යොදන නම කුමක් ද?

.............................................................................................................................................

34 I අක්ෂරයෙන් දැක්වෙන්නේ හින්දු ආගමට අයත් නිර්මාණයකි. එය කුමන නමකින් හැඳින්වේ ද?

.............................................................................................................................................

35 J අක්ෂරයෙන් දැක්වෙන පක්ෂි රූපය කුමන නමකින් හැඳින්වේ ද? ..........................................................

- **ප්‍රශ්න අංක 36 - 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති රූප සටහන යොදාගෙන පිළිතුරු සපයන්න.**



36 දකුණු පස රූපයෙන් දැක්වෙන්නේ කර්මාන්තයට ....................................................... අයත් නිර්මාණයකි.

37 මෙහි පළමු පියවර වන ලී කඳන් කපා පොතු ගසා කැබලිවලට වෙන්කර ගැනීම ...................................... යනුවෙන් හැඳින්වේ.

38 පැරණි ශිල්පීන් විසින් මෙම නිර්මාණය සඳහා භාවිතා කර ඇත්තේ ........................................ යන දැව වර්ගයි.

39 ................................................. ප්‍රදේශයේ මෙම කර්මාන්තය වඩාත් ප්‍රචලිතය.

40 ඉහත දැක්වෙන නිර්මාණය භාවිතා වන්නේ ........................................................... අවස්ථාවක ය.

(ලකුණු 1 x 40 = 40)

## II කොටස

- **'අ' කොටසින් හෝ 'ආ' කොටසින් එක් මාතෘකාවක් තෝරාගෙන චිත්‍රයක් නිර්මාණය කරන්න.**
- **චිත්‍රයේ මාතෘකාව හෝ අංකය, නම හෝ විභාග අංකය, පන්තිය චිත්‍රය පසුපිටෙහි ලියන්න.**

### 'අ' කොටස - ප්‍රකාශන

01 ආගමික වතාවත්වල යෙදී සිටින බැතිමතුන් පිරිසක්

02 හේනක හෝ කුඹුරක අස්වනු නෙලන ගොවියන් හා ගෙවිලියන් පිරිසක්

03 වැව් පිටියක නිදහසේ සැරිසරන ගවයින් රංචුවක්

### 'ආ' කොටස - මෝස්තර හා ග්‍රැෆික්

04 මලක්, කොළයක් යොදාගනිමින් වීත්ත රෙද්දකට ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.

05 ටීපෝ කවරයක් සඳහා මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.

06 ''වන සම්පත සුරකිමු'' තේමාව සඳහා වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න. (වර්ණ හතරකට සීමා කරන්න.)

(ලකුණු 60 යි.)

**පිළිතුරු පත්‍රය - I කොටස**

01 මුරගල 02 රත්නප්‍රාසාදය 03 නා රජ රුවයි 04 වටදාගෙය (උතුරු)
05 අර්ධ උන්නත/අධි උන්නත 06 මරවාහනම් 07 මැටි 08 ජාති, ජරා, ව්‍යාධ, මරණ
09 කොරවක් ගල 10 දිව්‍ය 11 කොහොඹා කංකාරිය (2)
12 අත් සකපෝරුව හෝ පා සකපෝරුව (1, 2) 13 අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාව (3)
14 ලෝල හස්ත මුද්‍රාව (1) 15 නිල්, කහ, රතු (2)
16 පේසා වළලු - ලංකාවේ ස්තූපවල පාදමට ඉහළින් ගර්භයට සම්බන්ධ වූ කවාකාර කොටස
17 වාත්තු කිරීම - පිත්තල කර්මාන්තයේ භාවිතා වන ශිල්ප ක්‍රමයකි.
18 කුම්බා - මුස්ලිම් පල්ලියේ ගෝලාකාර විශාල ශිඛරය, කුඟා යනුවෙන් ද මෙය හැඳින්වේ.
19 ව්‍යාප්ත මෝස්තර - මෝස්තර ඒකකයක් මගින් තලය පුරාම විසිරී යන අයුරින් රටාවකට අඳිනු ලබන ක්‍රමය/චිත්‍ර
20 ද්විතියක වර්ණ - මූලික වර්ණ දෙකක් එක හා සමානව මිශ්‍ර කිරීමෙන් සෑදෙන වර්ණ
(උදා- නිල් + රතු = දම් / කහ + නිල් = කොළ / රතු + කහ = තැඹිලි)
21 B 22 C 23 A 24 E 25 D 26 පර්යාවලෝකනය
27 20 වන සියවස 28 බිසෝ මාළිගය, සඳකඩ පහණ 29 කළුගල් 30 කොලාජ්
31 කතිර මල 32 නිර්ජීව 33 වකදෙක 34 යාළි 35 හේරුණ්ඩ පක්ෂියා
36 වෙස්මුහුණු 37 සණ කැපීම
38 වෙල් කඳුරු, දිය කඳුරු, රුක්අත්තන (එක් පිළිතුරක් සෑහේ)
39 අම්බලන්ගොඩ 40 ශාන්තිකර්ම

I කොටසට ලකුණු 40 යි.

II කොටසට ලකුණු 60 යි.

මුළු ලකුණු 100 යි.